# ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
# கடன் இணக்க சபைத் திணைக்களம்
# DEPARTMENT OF DEBT CONCILIATION BOARD

## වාර්ෂික වාර්තාව
## ஆண்டு அறிக்கை
## Annual Report 2017

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**கடன் இணக்கசபைத் திணைக்களம**

**DEPARTMENT OF DEBT CONCILIATION BOARD**

# වාර්ෂික වාර්තාව- 2017


ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

අංක 35 ඒ ,ආචාර්ය එන්.එම් පෙරේරා මාවත,

කොළඹ 08.

debtcociliation@gmail.com

# පටුන

පිටු අංකය

| | | |
|---|---|---|
| **01.** | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මෙහෙවර, අරමුණු, දැක්ම | **03** |
| **02.** | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව හැඳින්වීම | **04** |
| **03.** | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල තොරතුරු | **06** |
| **04.** | ණය සහනදායක මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධනය | **07** |

## ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**මෙහෙවර**

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් මුදලක් සඳහා ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේදොර, ඉඩකඩම් ආදී වූ නිශ්චල දේපලක් ණය සහනදායී අන්දමට වාරික මඟින් හා අඩු පොලී අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම.

**අරමුණු**

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කරයක් හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

**දැක්ම**

නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ ණය ගණුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙලක් සලසා දීම.

**ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ  කාර්ය සාධන වාර්තාව**

**හැඳින්වීම:**

ඉඩකඩම්,කුඹුරු, වතුපිටි නිවාස වැනි නිශ්චල දේපළ පොරොන්දු සින්නක්කර ඔප්පු,උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එම ණයගැති භාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි.

මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට  මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත.මෙම මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි.මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණය හිමියන්ටද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි .උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳීඇති නිශ්චල දේපළ පිළිබඳව ණයකරුට පහසුවන්නා වූත් ණයහිමි පිළිගනු ලබන්නාවූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි.මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නොතිසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අතිවිශාලය.එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතීඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

ණයසහනදායක මණ්ඩලය,අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් අයෙක් මණ්ඩලයේ සභාපති ලෙස පත් කෙරේ.

මණ්ඩලයේ සභාපති

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවකු ලෙස දිසා විනිශ්චයකාරවරයකු ලෙස ස්ථිර පත්වීමක් දරන හෝ දරා තිබෙන තැනැත්තකු හෝ

ලංකා සිවිල් සේවයේ 1 වන පන්තියේ සාමාජිකයකුව සිටි හෝ සිටියා වූ සහ දිසා විනිශ්චයකාරවරයකු ලෙස ධූරය දරන හෝ දරා තිබෙන තැනැත්තකු හෝ

අවුරුදු 15 කට නොඅඩු වෘත්තීය තත්වයක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයකු හෝ නීතිඥවරයකු විය යුතුය.

මණ්ඩලයේ අනෙක් සාමාජිකයින් 04 දෙනාගෙන්

අඩුම වශයෙන් එක් අයෙක්වත් අවුරුදු 15 කට නොඅඩු වෘත්තීය තත්වයක් තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයකු හෝ නීතිඥවරයකු විය යුතුය.තවද අඩුම වශයෙන් එක් අයෙක්වත් ලංකාවේ වෙළඳ හෝ වානිජ ව්‍යාපාරයෙහි නියුතුවූද මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලැබුවා වූ තැනැත්තකු විය යුතුය.මණ්ඩලයේ සභාපති හා අනෙක් සෑම සාමාජිකයෙක්ම තම පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලසීමාවකට නිලය දැරිය යුතුය.

මෙම මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී.මණ්ඩලය ඉදිරියේදී එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොලී ප්‍රමාණයන් අඩු කිරීමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත්කිරීමටද මණ්ඩලයට බලතල ඇත.එසේම ණය හිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත්කල නොතිසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශ්වික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරී තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම් දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදී එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක මේ පිළිබඳ විභාගයක් පැවැත්වෙන අවස්ථාවකදී මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබා දීමටත් පොලිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබා දී ඇත.

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| **කාණ්ඩය** | **අනුමත සංඛ්‍යාව** | **දැනට සිටින සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ලේකම් | 01 | 01(වැ.බ) | 01 |
| සංවර්ධන නිලධාරී | 02 | 02 | 00 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 09 | 06 | 03 |
| ලඝුලේඛක | 03 | 02(තාවකාලික) | 03 |
| කා.කා.ස | 04 | 04 | 00 |
| රියදුරු | 02 | 01 | 01 |
| **මුළු සංඛ්‍යාව** | 21 | 16 | 08 |

**2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා ණය සහනදායක මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | 2017.01.01-2017.12.31 | |
|---|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව | 825 | |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 372 | |
| ලැබුණු සමාලෝචන ඉල්ලුම්පත් සංඛ්‍යාව | 36 | |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | | 1233 |
| සමතයට පත්කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 147 | |
| නිෂ්ප්‍රභා කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 167 | |
| සමාලෝචන ඉල්ලුම්පත් සංඛ්‍යාව | 50 | |
| පසෙක තබන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 00 | |
| රෝලෙන් ඉවත් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 00 | |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 09 | |
| ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව | 31 | |
| එකතුව | | 404 |
| වසර අවසානයේ අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව | | **829** |

**2017 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වියදම්වල කාර්ය සාධනය**

| | ඇස්තමේන්තුගත මුදල | වියදම් | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 18468000.00 | 15672245.99 | 84.86% |
| මූලධන වියදම් | 850000.00 | 734125.09 | 86.37% |
| එකතුව | 19318000.00 | 16406371.08 | 84.93% |

**2017 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ප්‍රගතිය.**

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 1500000.00 | 300000.00 | 3500000.00 |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 791292.00 | 503091.40 | 2126404.60 |

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35ඒ, ආචාර්ය එන්.ඒ. පෙරේරා මාවත, කොළඹ 08.

கடன் இணக்க சபைத் திணைக்களம்
இல. 35 ஏ, கலாநிதி என்.எம். பெரேரா மாவத்தை, கொழும்பு 08

Department of Debt Conciliation Board
No 35A, Dr N.M Perera Mawatha, Colombo 08.

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
கடன் இணக்க சபைத் திணைக்களம்
Department of Debt Conciliation Board